# දුරු රටක නැටුම් ගුරුවරිය



චන්ද්‍රිකා ශිරෝමාලා කුමාරනායක, කැනඩාවේ පදිංචි සිංහල ජනතාව අතර හුරු පුරුදු නාමයකි. ඇය එහි වසන සිංහල දරු දැරියන්ගේ නැටුම් ගුරුතුමිය යි. උඩරට, පහතරට, භරත නැටුම් මෙන් ම නව නිර්මාණ උගන්වන ඇයගේ කලායතනය 2004 වර්ෂයේ දී ඇරඹුනේ දරුවන් පස් දෙනෙකුගේ සහභාගීත්වයෙනි. වර්තමානයේ දරුවන් 26 දෙනෙකු එහි නැටුම් කලාව හදාරනු ලබයි. සැතපුම් දහස් ගණනක් දුර රටක වෙසෙන අපේ දරුවන්ට සිරිත් විරිත් ඉගැන්වීමට ඇයගෙන් සිදුවන්නේ අපිරිමිත මෙහෙයකි.

“මම උපන්නේ මාතර. අපි කොළඹ පදිංචියට ආවා. නුගේගොඩ සෙන්ට් ජෝෂප් විද්‍යාලේ දි මම මුලින් ම නැටුම් හැදෑරුවා. පසුව රජිනා සෙල්වනායගම්, බියට්‍රිස් වීරසිංහ, ප්‍රීති ගනේගොඩ මහත්මීන්ගෙන් උඩරට, පහතරට, භරත නැටුම් ඉගෙන ගත්තා. මම ඔවුන්ගෙන් ඉගෙන ගත්ත දේ සම්ප්‍රදාය රැකගනිමින්, අලුත් අත්හදා බැලීම් සිදුකරමින් මාගේ සිසුවියන්ට උගන්වනවා. ප්‍රසාද් කුමාරනායක සමඟ විවාහ වී කැනඩාවේ පදිංචියට ආවේ 2000 දී පමණ...” ඒ ඇයගේ හඬ යි.

එතෙර මෙතෙර ඇය





“...අපේ සංස්කෘතික හරයන් රැක ගනිමින් නැටුම් උගන්වන පංතියක් පටන් ගත්තා. මෙහි පදිංචියට ආපු අයත්, කැනඩාවේ උපත ලද සිංහල දරුවනුත් බොහොම උනන්දුවකින් නැටුම් ඉගෙන ගන්නවා. සිංහල අවුරුදු, නිදහස් දින උත්සව, මංගල උත්සව කටයුතු වල දී අපේ දරුවන්ගේ දක්ෂතා දක්වන්න අවස්ථාන උදාවෙලා තියෙනවා. නිසියාකාර පුහුණුවකින් ඔවුන්ගේ සැගවුණු කුසලතා එළි දක්වන්න අත්වැලක් වීමට ලැබීම මට මහත් සතුටක්. මගේ කාලයත්, ශ්‍රමයත් කැප කලේ දරුවන්ට නැටුම් කලාව උගන්වන්න යි...” චන්ද්‍රිකා පැවසුවා ය.

කැනඩාව වැනි දුර රටකට ගොස් අපේ දේ අගයකරමින් පවත්වාගෙන යාමට දරන ප්‍රයත්නය නිසා චන්ද්‍රිකා ලැබූ බුහුමන් අපමණ ය. ඇගේ මෙම සද්කාර්යය මතු පරපුරට අපේ දේ රැක ගැනීමටත් අත්වැලක් වනු ඇතැයි යන්න අපගේ ද විශ්වාසය යි.

**ඔබටත් චන්ද්‍රිකාගේ මෙහෙවර විමසමින් ඇයව ඇමතීමට හැකියි.**

ඇගේ ලිපිනය ඃ
312 Edenbrook hill Dr,Brampton,ON
L7 A2 L7 Canada
දුරකථන ඃ #(905) 8467546 #(416) 7371434 (Mobile)

චමින්ද සියඹලාපිටිය